# වැඩ බැරි දාස ගැන කතා

9

නිකොලායි නොසොව්

# ගුවනේ පියෑඹීම



සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

# වැඩ බැරි දූස ගැන කතා

## නිකොලායි නෝසව්

9

# ගුවනේ පියෑඹීම

අනුවාදය - දැදිගම වි. රුද්රිගු

චිත්‍ර - බරීස් කලෞෂින්

නව පරිගණක සකැසුම - මාලක ලලනජීව

නව මුද්‍රණය 2018




සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස

91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08





බැලුම ඉහළ නැංග සැටිත්, මහ පොළොවෙන් එය කොතරම් ඉහළ නැංගා ද යන්න ගැනත් අපේ නිර්භය මගීන්ට දැනුණේ වත් නැහැ. විනාඩියකට පසුව ඒගොල්ල බැලුමට සවි කරලා තියෙන කූඩුවේ සිට බිම බලන විට, මිතුරන් අත් වනමින්, තොප්පි උඩ වීසි කරන සැටි ඔවුනට පෙනුණා. බිම හිටිය කුරුමිට්ටෝ ඔවුනට ජය පතා කෑ ගැසුවා.

"නැවත හමුවන තුරු ආයුබෝවන්!" දක්ස පාල සහ ඔහුගේ මිතුරෝ බිම හිටිය අයට කිව්වා.

ගුවනට නැගපු කට්ටිය බැලුම් කූඩුවේ ඉඳගෙන තොප්පි වනලා සුබ පැතුවා. අමතක පැංචා හිසට අත තිබ්බේ එයාගේ තොප්පිය අරගෙන වනා සුබ පතන්නට. හිසේ තොප්පිය නැති බව අමතක පැංචාට මතක් වුණේ ඒ වේලාවේ දී.

"සෙහොයුරනි! බැලුම නවත්වාපල්ලා!" අමතකයා කෑ ගැහුවා. "මට අමතක වෙලා තොප්පිය ගෙදර තියලා ඇවිත්."

"ඔයා හැමදා ම මොකක් හරි අමතක කරනවා!" දොඩවන්නා කියාපි.

"දැන් ඉතින් බැලුම නවත්වන්න බැහැ. හුළං නිවෙන තුරු බැලුම ඉහළ නගිනවා. ඊට පස්සෙ තමයි බිමට පාත් වෙන්නේ." දක්ස පාල විස්තර කළා.

"හරි වැඩක් නෙව, තොප්පිය නැතුව මට ගුවනේ ගමන් කරන්ට කියනවද?" අමතක පැංචා ඇහුවේ හිතේ අමාරුවෙන්.

"ඔයාගෙ තොප්පිය ඔයා ඇඳ යට තිබිලා හොයා ගත්තා නේද?" බොත්තම් පුංචා ප්‍රශ්න කළා.

"හොයා ගත්ත එක ඇත්ත තමයි. මට ඒ තොප්පිය දැම්මාම ඔලුවේ රස්නයක් ඇති වුණ හන්දා මම එය මේසය උඩ තිබ්බා. අන්තිම මොහොතේ දී අමතක වුණා."

"ඔයා හැමදාම අන්තිම මොහොතේ දී මොනවා හරි අමතක කරනවා" දොඩවන්නා කිව්වා.

"සෝයුරනි, බිම බලාපල්ලා! අපි අපේ ගේ පොඩිත්ත බිම තියලා ඉගිලෙනවා!" එහෙම කිව්වෙ වැඩ බැරි දාස.

හැම දෙනා ම හිනා වුණා. දොඩවන්නා දිගට ම දොඩවන්නට වුණා.

"ඔයා කල්පනා කළේ අපේ ගෙයත් අපත් එක්ක පියාඹයි කියල ද?"

"මම එහෙම කල්පනා කළේ නැහැ!" වැඩ බැරි දාස කතා කලේ අමනාපයෙන්. "මට පෙනුනා අපේ ගෙය බිම තියෙන හැටි. ඉතින් මම ඒ ගැන කිව්වා. අපි හැමදා ම ගෙදර ජීවත් වුණා. දැන් පියාසර කරනවා."

"ඔව්. අපි පියාසර කරනවා. කොහාට හරි යනවා!" දොඩවන්නා දෙඩෙව්වා.

"ඔයා දොඩවන්නා නිසා හැමදා ම දොඩවනවා. ගුවනට නැගලත් දෙඩවීම නවත්වන්නේ නැහැ."

"ඔයා මගේ දෙඩවීමට අකැමැති නම් යන අහක යන්න!"

"මම කොහේ යන්න ද?"

"ඔය කතා නවත්වපල්ලා! ගුවනේ පාවෙන විට නුඹලා කරන විවාදවල තේරුම කුමක් ද?"

ගුවන් බැලුම තවත් ඉහළ නැංගා. කුසුම් පුරය අත්ලේ තියෙන පුංචි නගරයක් වගේ පෙනුණා. ගෙවල් බොහොම පුංචියි. නගරයේ ඉන්න කුරුමිට්ටන්ව හඳුනා ගන්නවත් බැහැ. හුළං පාරට බැලුම ගහගෙන ගියා. දැන් නගරය ඈතින් පෙනුණා.

දක්ස පාල සාක්කුවෙන් මාලිමා යන්ත්‍රයක් අරගෙන බැලුවා. එහි කටුව උතුරු දිසාව පෙන්වනවා. මේ දිසා දර්ශක යන්ත්‍රයෙන් ආපසු යන මග හොයා ගන්න පුළුවනි. ඒ නිසා තමයි දක්ස පාල මේ යන්ත්‍රය ගෙන ගියේ.

"හුළං පාර හමන්නේ උතුරු දිසාවට. අපට ආපහු එන කොට දකුණු දිසාවට එන්නට ඕන" දක්ස පාල විස්තර කළා.



දැන් ගුවන් බැලුම බොහොම ඉහළට නැංගා. නගර පවා ඇහැට පෙනෙන්නේ නැහැ. කුඹුරු මැදින් ගලා බසින කැකිරි ගංගාව පුංචි දිය පාරක් වගේ පේනවා. වතුවල තියෙන ගස් පෙනුණේ ගිනිකූරු වගෙයි.

හිටි හැටියේ ම බොත්තම් පුංචා දුටුවා පුංචි කළු ලපයක්. ඒ ලපය ගුවන් බැලුම පසු පසින් දුවනවා වගේ ඉක්මණින් එන්නට පටන් ගත්තා.

"සෝයුරනි! අර බලාපල්ලා අපේ පසුපසින් දුවගෙන එන්නේ මොකක් ද?" බොත්තම් පුංචා කෑ ගසා ඇසුවා.

හැම දෙන ම කළු ලපය දෙස බලන්නට වුණා.

"බලන්න, ගඟට ඉහළින් පා වෙනවා!" අමතක පැංචා කෑ ගැසුවා.

"අන්න අර ලපය මොකක් ද? බලාපල්ලා ගස්වලටත් උඩින් ඒ ලපය පැනගෙන එන හැටි!" කඩිනම් රාළ කිව්වා.

ගුවන් බැලුම කැලෑවට උඩින් පියාසර කරනවා. කළු ලපය ගස් මුදුන්වලට ඉහළින් එනවා. පුංචි දොස්තර කණ්ණාඩි කුට්ටම ඇහේ ලා ගෙන ලපය දිහා බැලුවා. නමුත් එයාට ලපය හඳුනාගන්න බැරි වුණා.

"මම දන්නවා!" කියලා එක පාරට ම වැඩ බැරි දාස කෑ ගැසුවා. "නුඹලාට ඉස්සෙල්ලා මම තේරුම් ගත්තා! ඒ තමයි අපේ බුල්කා බලු පැටියා. අපට ඒ පැටියාව ගෙනෙන්ට අමතක වුණා නෙව. ඉතින් දැන් ඔය බුල්කා අපේ පසු පසින් දුවලා එනවා ඇති."

"ඔයා කියන්නේ මොනවා ද? බලු පැටියාව මම ගෙනාවා. ඌ අපේ බංකුව යට ඉන්නවා," දඩයම් සේන කිව්වා.

"ඔය ලපය මොකක් ද? සමහර විට අපේ දක්ස පාල ඒක දන්නවා ඇති නේ ද?" අනේ-අපොයි ඇහුවා.

දක්ස පාල මාලිමා යන්ත්‍රය සාක්කුවේ දමා ගෙන බිම බැලුවා.

"ඒ ලපය තමයි අපේ සෙවණැල්ල!" ඔහු සිනා සුනා.

"ඇත්තට ම ඒ අපේ හෙවණැල්ල ද?" වැඩ බැරි දාස පුදුම වුණා. "විස්තර කරන්න"



"බොහොම ලෙහෙසියි. ඔය ලපය අපේ ගුවන් බැලුමේ හෙවනැල්ල. අපි හුළං පාරට ඉගිලෙනවා. ඉතින් අපේ හෙවනැල්ලත් අපේ පස්සෙන් එනවා." දක්ස පාල කිව්වා.

ගුවනේ පාවෙන කුරුමිට්ටෝ බොහෝ වේලාවක් යන තුරු ලපය දිහා බලාගෙන හිටියා. ලපය කුඩා වීමට පටන් ගෙන අවසානයේ දී එය අතුරුදහන් වුණා.

"හෙවනැල්ල කොහේ ගියා ද?" හැමදෙනා ම කලබල වුණා.

"අපි දැන් බොහොම ඉහළට නැංග නිසා, අපට හෙවනැල්ල පෙනෙන්නේ නැහැ" දක්ස පාල විස්තර කළා.

"හරිම වැඩක් තමයි! අපි මෙතැන ඉන්නවා. අපේ හෙවනැල්ලවත් අපට පෙනෙන්නේ නැහැ." දොඩවන්නා දොඩවන්නට වුණා.

"ඔන්න ඔයා ආයෙමත් දොඩවන්න පටන් ගත්තා. ඔයාගෙන් අපට සැනසිල්ලක් නැහැ නෙව" එහෙම කිව්වෙ වැඩ බැරි දාස.

"සැනසිල්ල! සැනසිල්ල!" දෙඩවන්නා විහිළු කළා. "ගුවන් බැලුමකින් ගුවනේ පා වෙන විට, මොන සැනසීමක් ද?! සැනසීමෙන් ඉන්නට නම් ගෙදරට වෙලා ඉන්න!"

"ඔයා යන්න ගෙදර!"

"මට සැනසීමක් ඕන නැහැ."

"නුඹලා ආයෙමත් වාද කරනව ද? නුඹලාව බිමට බැස්සවීමට මට සිද්ද වෙනවා!" දක්ස පාල අවවාද කළා.

දොඩවන්නා සහ වැඩ බැරි දාස බය වෙලා වාද කිරීම නැවැත්තුවා.

මේ වන විට ගුවන් බැලුම දුමාරයකට නැති නම් මීදුමකට අහු වුණා. බිම බැලුවම මහ පොළොව පෙනෙන්නේ නැහැ. බිම සුදු පාටට පෙනෙනවා.

"මේ මොනවා ද? මේ දුම ආවේ කොහේ ඉඳල ද?" හැමෝ ම කෑ ගැසුවා.

"මේ දුම් නොවෙයි. වලාකුළු. අපි දැන් වලාකුළු ඇතුළට වැදිලා තියෙනවා. වලාකුළක් එක්ක පියාඹනවා" දක්ස පාල කරුණු විස්තර කළා.

"ඔයා ඒ කතාව කියන්නේ හිතින් ගොතලා. වලාකුළු හරියට කැඳ වගේ දියාරුව තියෙන්නට ඕන. මේක මීදුමක්," වැඩ බැරි දාස එයාගෙ අදහසට විරුද්ධ වෙලා කිව්වා.

"වලාකුළ හැදිලා තියෙන්නේ මොනවාවලින් ද?" දක්ස පාල ප්‍රශ්න කළා. "වලාකුළු හැදෙන්නේ මීදුමෙන්. මහ පොළොවේ ඉඳලා බලන විට අපට වලාකුළු ඝනව පේනවා."



එම විස්තරය විශ්වාස නොකළ වැඩ බැරි දාස මෙහෙම කියාපි.

"සෝයුරනි! එයාගෙ කතාව අහන්න එපා! එයා හිතින් හිතලා, ගොතලා කියනවා. එයා බොහෝ දේ දන්නවා කියලා අපට පෙන්වන්න හදනවා. නමුත් එයා කිසිම දෙයක් දන්නේ නැහැ. වලාකුළු හැදෙන්නේ මීදුමෙන් කිව්වාට මම විශ්වාස කරන්නේ නැහැ! වලාකුළු හැදෙන්නේ කැඳවලින්. හරියට මම කැඳ බීලා නැතුවා වගෙයි!"

ඉක්මණින් ම බැලුම තවත් ඉහළ නැංගා. දැන් එය පාවෙන්නේ වලාකුළුවලටත් උඩින්.

වැඩ බැරි දාස කූඩයේ ඉඳලා බිම බැලුවා. ඔහුට පෙනුණේ මහ පොළොව වසා සිටින වලාකුළු විතරයි.

"අනේ අම්මේ! ආකාසේ බිම! අපි දැන් පියාඹන්නේ දෙපා උඩ දමාගෙන. හිස බිමට හරවාගෙන!"

"දෙපා උඩ දමා ගෙන වෙන්නේ කොහොම ද?" අනෙක් අය විමතියට පත් වුණා.

"ඔන්න බලාපල්ලා. අපේ දෙපාවලට ආකාසේ වලාකුළු ගෑවෙනවා. ඉතින් අපි පියාඹන්නේ ඔළු බිම දමාගෙන."

"අපි දැන් වලාකුළුවලට උඩින් යනවා. අපේ ගුවන් බැලුම බොහොම උඩට නැගලා තියෙනවා. ඒ නිසා වලාකුළු අපට යටින් දැන් පාවෙන්නේ" දක්ස පාල විස්තර කළා.

නමුත් වැඩ බැරියා එය විශ්වාස කළේ නැහැ. ඔහු බංකුව උඩ වාඩි වෙලා දෑතින් ම තොප්පිය අල්ලා ගෙන හිටියා. එයා දෙපා උඩ දමාගෙන, ඔළුව බිමට හරවා ගෙන හිටිනවා කියලා විශ්වාස කළ හන්දා තොප්පිය එහෙම දෑතින් අල්ලා ගෙන හිටියා. සුළං පහරක් විසින් ගුවන් බැලුම ඇදගෙන ගියා. ඉක්මණින් ම බැලුම පාත්වෙන්නට පටන් ගත් සැටි ඔවුන්ට පෙනුණා.

"අපි පහළට පාත්වෙන්නේ මොකද?" කූඩුවේ වාඩි වෙලා හිටිය ළමයි ඇසුවා.

"බැලුමේ තියෙන හුළං නිවිලා." දක්ස පාල විස්තර කළා.

"දැන් ඉතින් අපි බිමට පාත් වෙනවා නේ ද?" කඩිනම් රාළ ඇසුවා.

"අපි වැලි මිටි කූඩයට දා ගත්තේ මක්නිසා ද?" දක්ස පාල ප්‍රශ්න කළා.

"අපි පහළට යන විට වැලි ගෝනි හිස් කරන්න ඕන."

අනේ-අපොයි වැලි මිටියක් අරගෙන එක පාරට ම බිමට විසි කළා.



"ඔයා මොනවා කළා ද?" දක්ස පාල කෑ ගැහුවා. "එක පාරට ම වැලි ගෝනි විසිකරන්න එපා. කාගෙවත් ඔලුවකට වැදුනොත්"

"සමහර විට නොවැදෙන්න පුළුවනි," අනේ-අපොයි කිව්වා.

"සමහර විට්ටයා-හැබෑ මොට්ටයා!" දක්ස පාල එයාට පොඩි විහිළුවක් කළා. "ගෝනියෙන් වැලි බිමට විසි කරන්න ඕන"

"එහෙනම් මම වැලි ඉහන්නම්" නොබය දාස කිව්වා.

එයා වැලි මිටියක් ලිහලා වැලි කූඩය ඇතුළට දැම්මා.

"අපොයි නුඹලා හැබෑ නුවණක්කාරයෝ!" දක්ස පාල එහෙම කියලා හිස වැනුවා. "වැලි ගෝනියේ තිබුණත්, කූඩයේ තිබුණත් වෙනසක් නැහැ නෙව ද? ඒ නිසා බැලුමේ බර අඩුවෙන්නේ නැහැ."

"බය වෙන්න එපා. මම වැලි ටික බිමට වීසි කරන්නම්" නොබය දාස වැලි මිටක් බැගින් අතින් අරගෙන බිමට වීසි කළා.

"පරෙස්සමින්!" අන්ද මන්ද කෑ ගැසුවා. "ඔයා මගේ ඇස් දෙකට වැලි දමාවි."

"බය වෙන්න එපා. මම ඇස්වලට වැලි ගහන්නේ නැහැ." එහෙම කියන ගමන් ම ඔහුගේ ඇස්වලට වැලි දැම්මා.

හැම දෙනාම නොබය දාසට බැන්නා. අනේ-අපොයි පිහියක් අරගෙන කූඩයේ අඩිය හිල් කරලා ලොකු සිදුරක් ඇති කළා. එයෙම කළේ වැලි බිමට ඉහිරිවන්නට. දක්ස පාල මේක දැකලා කෑ ගැහැව්වා.

"නැවතියන්! නුඹ මොනවා කරනවා ද? නුඹ හන්දා අපේ කූඩය කැඩිලා අප බිමට වැටේවි."

"සමහර විට නොවැටෙන්නට පුළුවනි." එහෙම කිව්වෙ අනේ-අපොයි.

"නුඹලා දෙන්නා නිතරම කියන්නේ වචන දෙකක් විතරයි. 'සමහර විට', 'බය වෙන්න එපා' කියලා විතරයි!" දක්ස පාල එහෙම කියලා පිහිය උදුරා ගත්තා.

කූඩයේ තිබුණු වැලි බිමට විසි කළා. බර අඩු වුණා ම බැලුම ආයෙමත් ඉහළ නැංගා. ළමයින් බොහොම සන්තෝස වෙලා වට පිට බලන්නට වුණා. ගුවන් බැලුම උඩ යන හන්දා සියල්ලෝ ම සතුටු වුණා. හැම තිස්සේ ම අසතුටින් ඉන්න දොඩවන්නා විතරක් දොඩවන්න පටන් ගත්තා.

"මොකක් ද මේකෙ තේරුම! වරක් ඉහළ යනවා! තවත් වරක් පහළ බහිනවා! ඔහොමත් ඉගිලෙනවා ද?"

තවත් මොනවා කියන්න ඕන ද කියා නොදැන ඔහු බොත්තම් පුංචා දිහා බැලුවා. ඒ වෙලාවේ දී බොත්තම් පුංචා සීනි කැටයක් හපමින් හිටියා.

"ඔයා හපන්නේ මොනවා ද?"

"මගේ සාක්කුවේ සීනි කැටයක් තිබුණා. ඉතින් මම ඒක අරගෙන හපන්නට පටන් ගත්තා"

"හරි වෙලාවට නොවැ හපන්නේ. බිම බැහැලා පසුව හපන්න බැරියැ."

"මම මොකට ද අමතර බරක් ගෙනියන්නේ? මම සීනි කැටය කෑවා ම එය බර අඩු වෙනවා. එතකොට බැලුම තවත් උඩට නගීවි."

"හපන්න! ඔය හැපිල්ල නිසා මොනවා වෙනව ද කියල කියන්න බැරියැ" දොඩවන්නා ආයෙමත් මුණු-මුණු ගෑවා.





වැඩ බැරි දාසගේ හපන්කම් ගැන ඔබ වැඩි දුරටත් සැලකිලි දක්වයි නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරයි නම් මේ පොත් පෙළට අයත් අනික් පොත් කියවන්න:

අනතුර

ගුවනේ පියෑඹීම

ISBN 978-955-1319-73-1

සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

LKR 200/-